# ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය

## ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේකය - 19

## නිකුත් කළ දිනය - 2010.09.06

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ (භාණ්ඩ හා වැඩ) සමග පරිශීලනය කිරීම සඳහා පහත සඳහන් ඡේදය වෙනුවට මෙම අතිරේකය භාවිතා කරන්න

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමු අංක 9.3.1
මෝටර් වාහන සහ අළුත්වැඩියා කිරීම

# රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව : 9.3.1**

**මෝටර් වාහන සහ උපකරණ අලුත්වැඩියා කිරීම**

9.3.1 (අ) අලුත්වැඩියා කිරීමේ ආර්ථික වාසිය, වාහනයේ වයස සහ තත්ත්වය සැලකිල්ලට ගෙන, ඉදිරිපත් කර ඇති මිල ගණන් සාධාරණ බවට ප්‍රසම්පාදන අස්ථිත්වය සෑහීමට පත් වන්නේ නම් නිෂ්පාදකයන්ගේ බලය ලත් දේශීය නියෝජිතයන් හරහා මෝටර් වාහන වලට සහ වෙනත් උපකරණ වලට අලුත්වැඩියා කිරීම් සිදු කළ හැකිය.

(ආ) ප්‍රසම්පාදන අත්පොතේ සඳහන් කර ඇති පරිදි, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අධිකාරය පැවරීමක් කළ හැකිය. එසේ වුවද, රුපියල් දෙලක්ෂයකට (රු.200,000.00) වැඩි අලුත්වැඩියා කිරීම් සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුය.